ඒඩ්ස් (AIDS) ක්ෂයරෝගය හා මැලේරියාව මර්දනය කිරීමේ ගෝලීය අරමුදල (GFATM)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් GFATM හි සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ (HSS) සංරචකයෙහි, පහත දැක්වෙන තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු

(කොන්ත්‍රාත් පදනම)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වනාහි ඒඩ්ස් ක්ෂයරෝගය සහ මැලේරියාව මර්දනය කිරීමේ කටයුතු සඳහාවූ ගෝලීය අරමුදල විසින් ප්‍රදානයන් හතරක් ලබාගත් ප්‍රධාන ප්‍රතිලාභියා වෙයි. මෙම ප්‍රදාන අතරට ශ්‍රී ලංකාවේ HIV/AIDS (ඒඩ්ස්), ක්ෂයරෝගය හා මැලේරියාව, වැළැක්වීමේ හා මර්දනය කිරීමේ කටයුතු හා උතුරු පළාතේ, සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ (HSS) කටයුතු සඳහා වන ප්‍රදාන අන්තර්ගත වේ.

සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කරලීමේ ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රදානය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ප්‍රදානය කරනු ලැබුවේ, උතුරු පළාතේ, ශක්‍යතා වර්ධනය කරලීමත්, සෞඛ්‍ය පද්ධතිය හි යටිතල පහසුකම් සංවර්ධනය කරලීමත් අරමුණු කරගෙනය. මෙකී ප්‍රදාන මගින් ආවරණය කෙරෙන ප්‍රධාන නාභි ප්‍රදේශ වන්නේ උතුරු පළාතේ මානව සම්පත් සංවර්ධනය හා සෞඛ්‍ය සත්කාර පහසුකම් ඉදිකිරීමත්ය. මුළු ප්‍රදානයේ වටිනාකම ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 15.5 ක් වනු ඇත.

ව්‍යාපෘති කළමනාකරු - (කොන්ත්‍රාත් පදනම - මට්ටම - PS 3 තනතුරු 01 යි.

(සෞඛ්‍ය පද්ධති ශක්තිමත් කරලීමේ සංරචකයන්) ව්‍යාපෘතීන් ව්‍යාපෘති කළමනාකරු විසින් සියළු ව්‍යාපෘති කටයුතු හා කාර්ය මණ්ඩලයට අදාළව ඵලදායී හා කාලීන කළමනාකරණ කටයුතු සහතිකව ඉටුකරවා ගැනීම සඳහා වගකීම් භාරය දැරිය යුතු වන අතර, "HSS" ප්‍රදානය (අරමුදල්) පිළිබඳ භාරකරු ලෙස ක්‍රියාකළ යුතුය. තවද ව්‍යාපෘති කළමනාකරු, කාලාවර්ත (වාර්ක) වැඩ සැලැස්ම, ප්‍රගති වාර්තා, මුදල් වැයකිරීම් / පියවීම් පිළිබඳ ඉල්ලීම්, යනාදිය හා නිර්මාණය හා කාලීනව ඉදිරිපත් කිරීම තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘතිය හා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය අතර, ප්‍රාථමික සම්බන්ධීකාරකය / කරු ලෙසද කටයුතු කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරු ඉහතකී GFATM ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා වෙත වාර්තා කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරු කොළඹ පිහිටි ව්‍යාපෘති කාර්යාලයෙහි රැඳී සේවය කළයුතු වන අතර, උතුරු පළාතේ, ව්‍යාපෘති වැඩබිම් වෙත නිරතුරුව හා විස්තීර්ණ ලෙස සංචාර සිදු කිරීම අවශ්‍ය වනු ඇත.

සුදුසුකම් හා පළපුරුද්ද :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෛද්‍ය විද්‍යාව / ඉංජිනේරු විද්‍යාව / ගෘහ නිර්මාණ ශිල්පය / වාස්තු විද්‍යාව / ව්‍යාපෘති කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සමග අඩුම තරමින් වසර 8 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද හෝ වසර 4 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

    හෝ

    විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් සහ වෛද්‍ය විද්‍යාව ඉංජිනේරු විද්‍යාව / ගෘහ නිර්මාණ ශිල්පය / වාස්තු විද්‍යාව / ව්‍යාපෘති කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් සමග අඩුම තරමින් වසර 6 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

    හෝ

    රජයේ දිපව්‍යාප්ත සේවයේ 1 වන පංතියේ නිලධාරියෙකු වීම හෝ සමාන තත්ත්වයේ පරිපාලන / ව්‍යාපෘති කළමනාකරණ මට්ටමේ තනතුරක නිලධාරියෙකු වීම සමග 1 වන පංතියේ තනතුරක අඩුම තරමින් වසර 5 ක පළපුරුද්ද.
02. අන්තර් ජාතික දායක අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල, සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘතිවල, කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් සහිත වීම පිළිබඳව වැඩි මනාපයක් දක්වනු ලැබේ.
03. ඉදිකිරීම් ව්‍යාපෘතිවල පළපුරුද්ද වාසිදායක වනු ඇත.
04. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ICTAD මාර්ගෝපදේශ පිළිබඳ පූර්ණ දැනුවත්භාවය සහිතවීම විශිෂ්ඨ වාසියක් වනු ඇත.
05. ඉංග්‍රීසි භාෂාවෙහි ප්‍රවීනතාව හා නිපුණතාවය (චතුර බව) සහ අඩුම තරමින් එක් දේශීය භාෂාවක නිපුණත්වය අවශ්‍යවේ. දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීනතාව සහ නිපුණත්වය විශිෂ්ඨ ලෙස වාසිදායක වනු ඇත.

ප්‍රසම්පාදන නිලධාරී - (කොන්ත්‍රාත් පදනම - මට්ටම - PS 6 - තනතුරු 01 යි.

සුදුසුකම් හා පළපුරුද්ද :

01 විශ්වවිද්‍යාල කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන, ප්‍රසම්පාදනය / සැපයුම් දාම කළමනාකරණය විෂයයක් වශයෙන් සහිතව අදාළ ක්ෂේත්‍රයේ හෝ ප්‍රසම්පාදනය හෝ සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 7 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රසම්පාදනය / සැපයුම් දම කළමනාකරණය පිළිබඳ හෝ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතාව / නිපුණතාව පිළිබඳ සහතිකයක් ලබා තිබීම

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපනය කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රසම්පාදනය / සැපයුම් දම කළමනාකරණය පිළිබඳව හෝ අදාළ ක්ෂේත්‍රයක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග අඩුම තරමින් වසර පහක (5) ක ප්‍රසම්පාදනය / සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද

හෝ

තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රසම්පාදන / සැපයුම් දම කළමනාකරණය පිළිබඳ හෝ අදාළ ක්ෂේත්‍රයක ප්‍රවීණතා / නිපුණතා සහතිකයක් සමග ප්‍රසම්පාදන / සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ අඩුම තරමින් වසර 10 ක පළපුරුද්ද.

02. පශ්චාත් උපාධි සුදුසුකම් හා සමාන සංයෝජනයෙන් යුක්තව ඖෂධීය හා සෞඛ්‍යමය නිෂ්පාදන ප්‍රසම්පාදනය පිළිබඳව වසර 5 ක (පහක) ස්වාස්ථ පළපුරුද්ද වාසිදායක වනු ඇත.

03. ප්‍රසම්පාදන හා සැපයුම් කළමනාකරණය පිළිබඳව ලබා ඇති විධිමත් පුහුණුව සුවිශිෂ්ට වාසියක් වනු ඇත.

04. ප්‍රසම්පාදනය පිළිබඳ විධිමත් සහතිකයක් සහිත වීම / ලබා ඇති බව (උදා : (CIPS) විශිෂ්ට ලෙස වාසිදායක වනු ඇත.

පරිපාලන නිලධාරී - (කොන්ත්‍රාත් පදනම - මට්ටම - PS 6 - තනතුරු 01 යි.

සුදුසුකම් හා පළපුරුද්ද :

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහ / හෝ පරිපාලනය / මානව සම්පත් කළමනාකරණයට අදාළ ක්ෂේත්‍රයක, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඊට සමාන වෘත්තීය සුදුසුකම් සමග පරිපාලන නිලධාරියෙකු / කණිෂ්ඨ විධායක නිලධාරියෙකු ලෙස වසර 2 ක පළපුරුද්ද.

02. සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකම වතාවකදී විෂයයන් හයකින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

03. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී එකම වතාවකදී අඩුම තරමින් විෂයයන් දෙකකට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

04. ඉහළ මට්ටමේ ස්වකාර්ය හිමිකාරීත්වය සහිත පෙරට යන ප්‍රගාමී පෞරුෂයක් සහිත කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියාකරන අයෙකු වීම.

05. ශක්තිමත් MS Office කුසලතා

06. විදේශීය අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘතියක (සෞඛ්‍ය අංශයේ නම් වඩා මැනවි) සේවය කර ලබාගත් පළපුරුද්ද වාසිදායකය.

07. ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ භාෂා පිළිබඳ ලේඛන හා කථන හැකියාව මනාව විශිෂ්ට අන්දමින් තිබිය යුතුය.

මුල්‍ය සහකාර - (කොන්ත්‍රාත් පදනම - මට්ටම - MN 1) තනතුරු 01 යි.

සුදුසුකම් හා පළපුරුද්ද :

01. සිංහල හෝ දෙමළ, ඉංග්‍රීසි භාෂාව ගණිතය, සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකම වතාවකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත්වීම.

02. එකම වතාවකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සියලුම විෂයයන් ගෙන් සමත්වීම. (පැරණි නිර්දේශය යටතේ එකම වතාවකදී විෂයයන් 3 කින් සමත්වීම ප්‍රමාණවත් වනු ඇත)

03. ශක්තිමත් MS Office දක්ෂතා / කුසලතා, ගිණුම්කරණ / ගණකාධිකරණ මෘදුකාංග පිළිබඳ පළපුරුද්ද විශිෂ්ට වාසියක් වනු ඇත.

04. ඉංග්‍රීසි සහ සිංහල හෝ දෙමළ භාෂා පිළිබඳ මනා ලේඛනමය හා කථනමය දැනුම සහිත විය යුතුය. (හැසිරවීමේ මනා හැකියාව).

05. විදේශීය අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘතිවල පළපුරුද්දක් සහිත අයහට ප්‍රමුඛතාවයක් දක්වන අතර, එම සෞඛ්‍ය අංශයේ මුල්‍ය / මානව සම්පත් දෙපාර්තමේන්තුවල සේවා පළපුරුද්ද සහිත නම් වඩා මැනවි.

මෙම පුරප්පාඩු දැන්වීම පිළිබඳ සම්පූර්ණ විස්තර ලබා ගැනීම සඳහා මෙම වෙබ් අඩවිය වෙත පිවිසෙනු මැනවි. www.ccmsl.lk (under news and events) සියලුම අයදුම්පත්, විස්තරාත්මක ජීවදත්ත තොරතුරු ප්‍රකාශ (CV) සහ අදාළ සහතිකවල හා ලිපිලේඛනවල පිටපත්ද සමග (සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතික හා ලිපිලේඛනවල පිටපත්) 2016 නොවැම්බර් මස 17 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

ව්‍යාපෘති අධ්‍යක්ෂක,
GFATM ව්‍යාපෘති කාර්යාලය, 3 වන මහල,
මහජන සෞඛ්‍ය සංකීර්ණය.
අංක. 555/5, ඇල්විටිගල මාවත, කොළඹ 5.
ෆැක්ස් අංකය : +94 11 2368885 / ඊමේල් : vacancygfatm@gmail.com